මහ මැතිවරණ උණුසුමෙන් රටම ගිනි ඇවිළී ඇති මොහොතක පක්ෂ විපක්ෂ දේශපාලනඥයෝ කිහිප දෙනෙක් රිවිර ඉරිදා සංග්‍රහය සමග සංවාදයට එකතු වූහ. එහි දී චමල් රාජපක්ෂ, චම්පික රණවක, මිලින්ද මොරගොඩ, තිස්ස අත්තනායක, කේ. ඩී. ලාල්කාන්ත සහ වජිර අබේවර්ධන යන මැති ඇමැතිවරුන් දැක්වූ අදහස් මෙසේ පෙළ ගැසෙයි.

# "වේදිකාවල කතා සහ ජනතාවගේ ප්‍රශ්න අතර විශාල පරතරයක් තිබෙනවා"

ප්‍ර - ඔබ මෙයට පෙර වතාවේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ඡන්දවලින්. නමුත් ටික කලකින් ඔබ පිල මාරු කළා. මෙවර සන්ධානය යටතේ කොළඹ දිස්ත්‍රික්කයෙන් තරග කරලා ජයග්‍රහණයක් ලබා ගන්න පුළුවන් කියන විශ්වාසය ඔබට තියෙනවාද?


පි - අද වන විට ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය ගෝත්‍ර ක්‍රමයක් බවට පත් වෙලයි තියෙන්නේ. මෙය සම්පූර්ණයෙන්ම වැරදියි. මේ රටේ දේශපාලන ශබ්දකෝෂයම වෙනස් විය යුතුයි. විශේෂයෙන්ම තරගය, ජයග්‍රහණය වගේ වචන එයින් ඉවත් විය යුතුයි. මැතිවරණයේදී ජයග්‍රහණය කරන්න ඕනා පුද්ගලයන් නොවේ. ජනතාවයි. ඒ නිසා මම පාට හෝ පක්ෂ යන දේ ඒ තරම් සලකන්නේ නැහැ. මම හිතන්නේ දැන් අපේ ආකල්ප වෙනස් විය යුතු බවයි. මේ රටේ තිබෙන දේශපාලන සංස්කෘතිය වෙනස් කළ හැක්කේ ඒ විදිහට ආකල්ප වෙනස් කිරීමෙන් පමණයි.

මේ මැතිවරණයේදී අපි යෝජනාවලියක් ජනතාවට ඉදිරිපත් කරලා තියෙනවා. ඒ යෝජනාවලිය පිළිගන්නවාද නැද්ද කියන එක තීරණය කරන්නේ ජනතාවයි. කොළඹ දිස්ත්‍රික්කයේ ලක්ෂ දහයක එකොළහක පමණ ඡන්දදායක පිරිසක් ඉන්නවා. මෙයින් ලක්ෂ දෙකක් පමණ අර කියපු විදිහට ගෝත්‍ර ක්‍රමයට අහුවෙලා ඉන්න පුළුවන්. ලක්ෂ අටක් විතර ඉන්නවා මේ ක්‍රමයෙන් පිට. ඔවුන් තමයි නිහඬ බහුතරය. අපේ මැතිවරණ ව්‍යාපාරයෙන් අප අවදි කරන්න උත්සාහ කරන්නේ මේ නිහඬ බහුතරයයි.

ප්‍ර - ඔබේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තරමක් වෙනස් එකක්. කුඩා පරිමාණයේ ජනහමු, ගෙන්ගෙට යාම් වැනි දේවල් ගැනයි ලංකා ජාතික සංගමය විශ්වාසය තබා තියෙන්නේ. මේ තරම් තරගකාරී මැතිවරණයකට ඒ අයුරින් මුහුණ දෙන්න පුළුවන් කියලා ඔබ හිතනවාද?

පි - ඒ පවත්වන්නේ ජනතාවත් සමග සිදු කෙරෙන සාකච්ඡා. ඒ සාකච්ඡාවලදී ජනතාව තර්ක කරනවා. අප සමග විවාද කරනවා. මැතිවරණ වේදිකාවල පැය ගණන් අපට කතා කරන්න පුළුවන්. නමුත් අප කතා කරන දේවල් ජනතාවට තේරෙනවාද කියන ප්‍රශ්නය මතු වෙනවා. වේදිකාවේ කතා කරන දේවල් සහ ජනතාවගේ ප්‍රශ්න අතර ලොකු පරතරයක් තියෙනවා. අප කරන්නේ මේ පරතරය නැති කිරීමයි. ගෙන් ගෙට යාමේ ව්‍යාපාරයත් ඒ අතරින් ප්‍රධානයි.

මගේ මැතිවරණය ව්‍යාපාරයේ තේමාව වන්නේ සල්ලි නාස්ති නොකර එය පැවැත්වීමයි. සාමාන්‍යයෙන් ලංකාවේ පොත් බෙදාදීමේ උත්සවයක් පැවැත්වුණොත් ඒ පොත් සඳහා වැය වෙන්නේ ලක්ෂ දෙකක තුනක මුදලක්. නමුත් ලක්ෂ 10ක් 12ක් වැය කරනවා උත්සවය සහ ප්‍රචාරය සඳහා. මේ ක්‍රමය අප වෙනස් කළ යුතුයි. මම නිතරම කිව්වේ විශාල රැස්වීම්, මල් මාලා පැලඳවීම් වැනි දේවල් අවශ්‍ය



අමාත්‍ය මිලින්ද මොරගොඩ

**මගේ මැතිවරණය ව්‍යාපාරයේ තේමාව වන්නේ සල්ලි නාස්ති නොකර එය පැවැත්වීමයි. සාමාන්‍යයෙන් ලංකාවේ පොත් බෙදාදීමේ උත්සවයක් පැවැත්වුණොත් ඒ පොත් සඳහා වැය වෙන්නේ ලක්ෂ දෙකක තුනක මුදලක්. නමුත් ලක්ෂ 10ක් 12ක් වැය කරනවා උත්සවය සහ ප්‍රචාරය සඳහා. මේ ක්‍රමය අප වෙනස් කළ යුතුයි. මම නිතරම කිව්වේ විශාල රැස්වීම්, මල් මාලා පැලඳවීම් වැනි දේවල් අවශ්‍ය නැහැ කියලයි.** ”

නැහැ කියලයි.

ප්‍ර - මේ මැතිවරණයේදී ආණ්ඩුව ඉදිරිපත් කරන ප්‍රධාන සටන් පාඨය වන්නේ පාර්ලිමේන්තුවෙන් තුනෙන් දෙකක බලයක් තමන්ට ලබා දෙන්නයි කියන එකයි. මේ මැතිවරණයේදී ජනතාව ඒ විදිහේ විශාල බහුතර බලයක් සන්ධානයට ලබා දෙයි කියලා ඔබට විශ්වාසයක් තියෙනවාද?

පි - මැතිවරණයකදී තීන්දුව දෙන්නේ ජනතාව. ඒක ජනතාවට භාර දිය යුතුයි. ජනතාව දෙන තීන්දුව මම දෙන්න ගියොත් ඒක ඒ තරම් ගැළපෙන්නේ නැහැ. යුද්ධය ජයග්‍රහණය කරන්න ජනාධිපතිතුමා පුළුල් සන්ධානයක් හැදුවා. දැන් රටේ සාමය සහ සංවර්ධනය ස්ථාපිත කරන්නත් එවැනි සන්ධානයක් හැදිය යුතුව තිබෙනවා. ඒකටයි අපි ජනාධිපතිතුමාට සහාය විය යුත්තේ.

ප්‍ර - නමුත් ලංකාවේ දේශපාලන ඉතිහාසයේ හැම වතාවකම සනාථ වෙලා තියෙන්නේ විශාල බහුතරයක් සහිතව ගොඩනැගෙන ආණ්ඩු අත්තනෝමතික තීරණ රාශියක් ගෙන ඇති බවයි. 70 සමගි පෙරමුණු ආණ්ඩුවට මෙන්ම 77 එජාප ආණ්ඩුවටත් ඒ චෝදනාව එක ලෙසින්ම එල්ල වෙනවා. ඒ නිසා ජනතාවගේ තුනෙන් දෙකක බලයක් ඉල්ලීම සාධාරණද? අනෙක් අතින් එය විපක්ෂය මර්දනය කරන්න ඉල්ලන ආයුධයක් කියලත් හිතන්න බැරිද?

පි - මෙහෙමයි. ඔතනත් ප්‍රශ්නය වෙන්නේ ලංකාවේ දැනට තියෙන ගෝත්‍ර ක්‍රමයයි. හැම තිස්සේම රජයක් බලන්නේ තමන්ට තියෙන බලය රැක ගන්නයි. විපක්ෂය බලන්නේ රජයෙන් ඒ බලය ඩැහැගන්නයි. මේ නිසා ඡන්ද කාලෙට විශාල තරගයක් තියෙනවා. මේ නිසා මා යෝජනා කරන්නේ මැතිවරණයෙන් පස්සේ ජාතික රාමුවකට වැඩ කළ යුතු බවයි.

ප්‍ර - එළැඹෙන මැතිවරණයෙන් පස්සේ සන්ධානය ජයග්‍රහණය කළොත් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් එන බව ඉතාම පැහැදිලියි. ඒ ව්‍යවස්ථාවේ රටේ මූලික ප්‍රශ්න විසඳන්න අවශ්‍ය කරන දැක්ම සන්ධානයට තියෙනවාද?

පි - ඔව්. මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම අනිවාර්යයෙන්ම සිදුවිය යුතු බව අප විශ්වාස කරනවා. ඒ වගේම ජාතික ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලබා දිය යුතුයි. මම හිතන්නේ 13 වැනි සංශෝධනය තුළ මේ සඳහා හුගක් ඉඩකඩ තියෙනවා. මම මේ කතා කරන්නේ ඉඩම් හෝ පොලිස් බලතල ගැන නෙමෙයි. ඊට වඩා හුගක් දේවල් තාමත් අපි අතින් සිදු නොවී තියෙනවා.

නිදර්ශනයක් විදිහට සංචාරක කර්මාන්තය ගනිමු. හම්බන්තොට, ත්‍රිකුණාමලය හෝ යාපනය වැනි ප්‍රදේශයක සංචාරක නිකේතනයක් විවෘත කරන කෙනෙක් ඒ සඳහා අනිවාර්යයෙන්ම කොළඹ ආ යුතුයි. ඇයි ඒවා ඒ පළාත්වලම කර ගන්න අවශ්‍ය පසුබිම සකසන්න බැරි. ඒ විදිහට ප්‍රායෝගික ප්‍රශ්න තියෙනවා. එම නිසා ඉහළ මට්ටමේ කරන ව්‍යවස්ථා වෙනස්කම්වලට කලින් බිම් මට්ටමේ ඇති ප්‍රශ්න විසඳිය යුතුයි. බිම මට්ටමේ විසඳීම තුළින්ම ඒ සඳහා අවශ්‍ය මඟක් පාදා ගත හැකියි. විශේෂයෙන්ම ජනාධිපතිතුමා යෝජනා කරලා තියෙන සෙනෙට් සභාව ඉතාම වැදගත්.

ප්‍ර - ඔබ නායකත්වය දරන ලංකා ජාතික සංගමය ප්‍රධාන ධාරාවේ පක්ෂයක් නෙමෙයි. මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ඔබේ පක්ෂය වැනි පක්ෂවලට දැනෙන්නේ මොන විදිහටද?

පි - මම හිතන්නේ ජර්මානු මැතිවරණ ක්‍රමය හොඳයි. ඒ කියන්නේ කේවල ක්‍රමය හා අනුපාත ක්‍රමය මිශ්‍ර කරලා සෑදූ මැතිවරණය ක්‍රමයක්. අපේ සංගමයට පටු අරමුණු නැහැ. අපට අවශ්‍ය රට එකතු කරන්නයි. අපට වාසි දේ නෙමෙයි අප බලන්නේ රටට වාසි දේයි. ඒ තුළ අපේ පැවැත්ම හදා ගන්න අප දැන ගත යුතුයි. කුමන දේශපාලන පක්ෂයක් වුණත් කටයුතු කරන්න ඕනේ ඒ විදිහටයි.

**රසික ජයකොඩි**